බුද්ධිමය දේපළ අරමුදල - 2019
---------------------------------

**1.1** තත්ත්වාගණනය කළ මතය
-----------------------------

බුද්ධිමය දේපළ අරමුදලේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අරමුදලේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2** තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3** මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්
------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

**1.4** විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යූහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති,

පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5** මූල්‍ය ප්‍රකාශන

**1.5.1** මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් අරමුදල විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

**1.5.2** ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| අ) | දෙසැම්බර් මාසයේ ගැසට් නිවේදන පලකිරීමට අදාලව ගෙවියයුතු රු.1,408,088 ක් උපචිත වියදම් ලෙස සමාලෝචිත වර්ෂයේ ගිණුම් වලට ගලපා නොතිබුණි. | පිළිගනිමි.<br>ඉදිරි වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීමේ ගිණුම්කරණ දෝෂය නිවැරදි කරන ලෙසට උපදෙස් ලබා දී ඇත. | වර්ෂයට අදාලව දරනු ලබන සියළුම වියදම් අදාල වර්ෂය තුලදී ගිණුම් ගත කිරීමට කටයුතු කල යුතුයි |
| ආ) | වර්ෂයේ ක්ෂය රු.214,023 ක් වැඩිපුර ගිණුම්ගත කර තිබුණි | පිළිගනිමි.<br>2020 වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීමේ දී මෙම ගිණුම්කරණ දෝෂය නිවැරදි කරන ලෙසට ගණකාධිකාරී වෙත උපදෙස් ලබා දී ඇත. | ක්ෂය නිවැරදි අගය ගිණුම්ගත කල යුතුයි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.**87,006,250** අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.**91,523,739** ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. **4,517,489** ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට වෙළඳ ලකුණු ආදායම රු. **2,835,907** ක් අඩුවීම හා සැපයුම් හා පාරිභෝජන ද්‍රව්‍ය වියදම රු. **3,113,387** ක් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වෙළඳ ලකුණු ලියාපදිංචි කිරීම | | |
| (i) | සමාලෝචිත වර්ෂය තුල ලියාපදිංචි කරන ලද වෙළඳ ලකුණු සංඛ්‍යාව 14,993 ක් වූ අතර ඒ තුල 1976 සිට 2008 දක්වා ලැබුණු අයදුම්පත් 2091ක් විය.ඒ අනුව වෙළඳ ලකුණු ලියාපදිංචිය සඳහා වර්ෂ 11 සිට 43 දක්වා කාලයක් ගතවී තිබුණි. ලියාපදිංචිය වලංගු දිනය පිළිගත් අයදුම්පත් ඉදිරිපත්කල දිනය වන අතර වෙළඳ ලකුණක් වසර 10 ක කාලයක් දක්වා වලංගු වේ. ඒ අනුව 2009 ට පෙර ලැබී ඇති අයදුම්පත් සඳහා ලියාපදිංචි සහතික නිකුත් කරන අවස්ථාව වන විට වසර 10 ක වලංගු කාලයද අවසන් වී තිබුණි. | පිළිගනිමි.<br>අයදුම්පත සලකා බැලීමේදී ලබාදිය යුතු අනිවාර්ය කාලසීමාවන් බලපානු ලැබීම, අයදුම්කරුගේ පාර්ශවයෙන් සිදුවන ප්‍රමාද, ඉදිරිපත්වන විරෝධතා පරීක්ෂණ, අධිකරණයේ පවතින නඩු කටයුතු හා ලකුණෙහි හිමිකාරිත්වය වෙනත් පාර්ශවයකට පැවරීම යනාදිය හේතු වේ. | වෙළඳ ලකුණු ලියාපදිංචි කිරීමේ කටයුතු කඩිනම් කිරීමට කටයුතු යෙදිය යුතුව ඇත. |
| (ii) | සමාලෝචිත වර්ෂයේදී වෙළඳ ලකුණු අයදුම්පත් 10,385ක් ලැබීතිබුණු අතර එම අයදුම්පත් වලින් 4612 ක පරීක්ෂණ කටයුතු ආරම්භ කර තිබුණු අතර අයදුම්පත් කිසිවක් ලියාපදිංචිය සඳහා යොමුකර නොතිබුණි. පූර්ව වර්ෂ වලදී සිදුවී තිබුණු ප්‍රමාදයන් හේතුවෙන් එම වර්ෂවලදී ලද අයදුම්පත් වලට අදාලව මෙම වර්ෂයේදී ප්‍රමුඛතාවය ලබා දීම මෙයට හේතුවී ඇති බව නිරීක්ෂණය විය. | පිළිගනිමි.<br>මූලික පරීක්ෂණ හා ද්විතියික පරීක්ෂණ වාර්තා සියල්ල සහකාර අධ්‍යක්ෂකවරු දෙදෙනෙකු මගින් පමණක් අනුමැතියට යොමුවීම සහ පෙර වර්ෂයන්හි ගොනුකර ඇති අයදුම්පත් සඳහා ප්‍රමුඛත්වය ලබා දීම මීට හේතු විය. | වෙළඳ ලකුණු ලියාපදිංචිය කඩිනම් කරමින් ඉල්ලුම්කරුවන්ට සේවා සැපයීම කඩිනම් කල යුතුයි. |

| | | | |
|---|---|---|---|
| **(iii)** | සමාලෝචිත වර්ෂය ආරම්භයේදී පරීක්ෂණ කටයුතු ආරම්භ කර නොමැති මුළු ඉල්ලුම් පත් සංඛ්‍යාව **6746** ක් බව ඉදිරිපත් කර ඇති වාර්තා අනුව නිරීක්ෂණය වන අතර **2019** දෙසැම්බර් **31** දින වන විට එම සංඛ්‍යාව **6713**ක් වී තිබුණි. පෙර වර්ෂවලදී සිදුවූ ප්‍රමාදයන් දිගින් දිගටම සිදුවීම මෙයට හේතුවූ බව නිරීක්ෂණය විය. | පිළිගනිමි.<br>වර්ෂ අවසානයේ පරීක්ෂණ කටයුතු ආරම්භ කර නොමැති ඉල්ලුම්පත් සංඛ්‍යාව **6713** වී තිබුණි. | වෙළඳ ලකුණු ලියාපදිංචි කිරීමේ කටයුතු යාවත්කාලීන කල යුතුයි. |
| **(iv)** | සමාලෝචිත වර්ෂය අවසාන වන විට **1994** වර්ෂයේ සිට විවිධ වර්ෂවලදී ගැසට් පත්‍රයේ පල කිරීමට ගාස්තු ගෙවා තිබුණද, ගැසට් පත්‍රයේ පල කිරීම කර නොතිබුණු සංඛ්‍යාව **4344** ක්ද, **1987** වර්ෂයේ සිට විවිධ වර්ෂවලදී ලියාපදිංචි ගාස්තු ගෙවා තිබූ නමුත් ලියාපදිංචි සහතික නිකුත් කර නොමැති සංඛ්‍යාව **3193** ක් විය. | පිළිගනිමි.<br>ඉල්ලුම්කරුගේ පාර්ශවයෙන් අදාල ගාස්තු ගෙවීම සඳහා වන ප්‍රමාදයන් සිදුව තිබේ. **2019** වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති මගින් අතපසු වූ රාජකාරී අවම කර ඇත. | වෙළඳ ලකුණු ලියාපදිංචි කිරීමේ කටයුතු යාවත්කාලීන කල යුතුයි. |
| **(v)** | ගැසට් පත්‍රයේ පළ කිරීම් සඳහා ගාස්තු ගෙවා තිබූ නමුත් මේ දක්වා පළ කිරීම් කර නොතිබුණු ලකුණු නියැදියක් **(10)** පරීක්ෂා කිරීමේදී ගාස්තු ගෙවීමෙන් පසු වූ ප්‍රමාද කාලය වර්ෂ **01** සිට වර්ෂ **10** දක්වා වූ කාල පරාසයකට අයත් විය. ගාස්තු ගෙවා තිබුණද ගැසට් පත්‍රයේ පළ කිරීමට අදාල ජ'නල් පිළියෙල කිරීම හා ගැසට් නිවේදන පිළියෙල කිරීම් සිදුකිරීමේ ප්‍රමාදයන් මෙයට හේතු වී තිබුණි. | පිළිගනිමි.<br>බුද්ධිමය දේපල පනතේ විධිවිධාන අනුව, බුද්ධිමය දේපල අධ්‍යක්ෂ ජනරාල්වරයා වගඋත්තරකරු කරමින් අධිකරණයේ නෛතික ක්‍රියාමාර්ග ක්‍රියාත්මකව පැවතුණි. | -එම- |
| **(ආ)** | නව නිපැයුම් සඳහා පේටන්ට් බලපත්‍ර ලියාපදිංචි කිරීම<br>-------------------------------------------- | | |
| **(i)** | සමාලෝචිත වර්ෂය තුල ලියාපදිංචි කරන ලද පේටන්ට් බලපත්‍ර සංඛ්‍යාව **175** ක් වූ අතර ඒවා **2006** සිට **2018** දක්වා වර්ෂවල ලද අයදුම්පත් වේ. ඒ අනුව මෙම පේටන්ට් බලපත්‍ර ලියාපදිංචි කිරීම සඳහා වර්ෂ **1** සිට වර්ෂ **13** ක කාලයක් ගතවී තිබුණි. ආයතනයේ අනුමත පේටන්ට් පරීක්ෂක තනතුරු **10** ක් ඇති අතර ඉන් **09** ක් පුරප්පාඩුව පවතී. මෙම පුරප්පාඩු පුරවා ගැනීම සඳහා විභාගයන් පවත්වා සුදුස්සන් බඳවා ගැනීමේ කටයුතු මේ | නිවැරදියි.<br>පේටන්ට් බලපත්‍රයක් ප්‍රදානය කිරීමට ප්‍රථම, විවිධ පියවර පරීක්ෂා කරනු ලැබේ. එබැවින් සැලකිය යුතු කාලයක් ගත වේ.<br>එමෙන්ම පේටන්ට් පරීක්ෂකවරුන් ලෙස නව විද්‍යා උපාධාරීන් බඳවා ගැනීම සම්බන්ධව කටයුතු සිදු කරමින් පවතී.<br>තවද නිවරදිව ගොනු | පේටන්ට් බලපත්‍ර නිකුත් කිරීමේ කටයුතු යාවත්කාලීන කල යුතුයි. |

| | | | |
|---|---|---|---|
| | දක්වා අවසන් කර නොමැති වීම හා පෙර වර්ෂ වලදී පේටන්ට් බලපත්‍ර ලියාපදිංචිය ප්‍රමාද වීම නිසා ලිපිගොනු ගොඩගැසීමද මෙයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි. | කිරීමට අවශ්‍ය සහය ශ්‍රී ලංකා නව නිපැයුම් කොමිසමෙන් ලබා දෙන ලෙසට ඔවුන්ව දැනුවත් කර ඇත. ඒ අනුව පුහුණු වීම්ද ලබා දී ඇත. කෙසේ වුවද මෙම කටයුතු මෙතෙක් සාර්ථකව ඉටුකර ගැනීමට නොහැකි වී ඇත. | |
| **(ii)** | පනතේ **83(2)** වගන්තිය ප්‍රකාරව පේටන්ට් බලපත්‍රයක් ප්‍රදානය කරන දින සිට දෙවන අවුරුද්ද ඉකුත් වූ විට එය බලාත්මකව තබා ගැනීමට දෙවන අවුරුද්ද සහ පේටන්ට් බලපත්‍ර වලංගු කාල සීමාව ඇතුළත වූ එක් එක් අනුප්‍රාප්තික අවුරුද්ද ඉකුත් වන දිනයට මාස **12** කට පෙර නියමිත වාර්ෂික ගාස්තුව ඔහු විසින් ගෙවිය යුතුයි. නමුත් **2019** ජනවාරි **01** දින වන විට ලියාපදිංචි කර ඇති මුළු පේටන්ට් බලපත්‍ර සංඛ්‍යාව **4831** ක් වූ නමුත් **2019** වර්ෂයේදී පේටන්ට් බලපත්‍ර අළුත් කිරීම් **439** ක් පමණක් සිදු කර තිබුණි. පේටන්ට් බලපත්‍රලාභීන්ට නව නිපැයුම් සඳහා වාණිජකරණය කිරීමට ඇති දුෂ්කරතාවය මීට හේතු වී ඇත. | නිවැරදියි. නව නිපැයුම් වාණිජකරණය කිරීමේ දුෂ්කරතාවයන් සැලකිල්ලට ගෙන වසර කිහිපයක් අලුත් කිරීම් ගාස්තු ගෙවීමට ප්‍රමාදයන් පැවතුනද නියමිත අධිගාස්තුව ගෙවා බලපත්‍රය අලුත් කිරීම සිදු කර ගැනීමට බලපත්‍රලාභීන්ට අවස්ථාව සලසා දෙනු ලැබේ. මේ ආකාරයෙන් කටයුතු කිරීමට ගරු නීතිපතිවරයාගේ මතයද ලබා දී ඇත. | ලියාපදිංචිය හා අළුත් කිරීමේ කටයුතු පිළිබඳව බලපත්‍රලාභීන් දැනුවත්කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සුදුසු වේ. |
| **(ඇ)** | කාර්මික සැලසුම් | | |
| **(i)** | සමාලෝචිත වර්ෂය තුල ලියාපදිංචි කරන ලද කාර්මික සැලසුම් සංඛ්‍යාව **258**ක් විය. ඒවා **2012** සිට **2019** වර්ෂ දක්වා කාලය තුල ලැබුණු අයදුම්පත් විය. ඒ අනුව මෙම අයදුම්පත් ලියාපදිංචිය සඳහා මාස **6** සිට වර්ෂ **7** දක්වා කාලයක් ගතවී තිබුණි. අයදුම්කරුවන්ට අඩුපාඩු පිළිබඳ දන්වා යැවීමට කටයුතු ප්‍රමාදවීම හා ඒවා පිළිබඳ පසුවිපරම් කිරීම ප්‍රමාදවීම මෙයට හේතුවී තිබුණි. | නිවැරදියි. **2012 /**වර්ෂයේ ලද කාර්මික සැලසුම් අයදුම්පත එහි පැවති අඩුපාඩුවක් හේතුවෙන් එම දෝෂය දන්වා නිවරදි කරන ලෙස ඉල්ලුම්කරු වෙත දැනුම් දී ඇත. ඒ අනුව එම කාර්මික සැලසුම් **2019/07/30** දින ලියාපදිංචි කරන ලදී. | කාර්මික සැලසුම් ලියාපදිංචි කිරීමේ කටයුතු කාර්යක්ෂම කල යුතුයි. |
| **(ii)** | පනතේ **46(3)** ප්‍රකාරව කාර්මික සැලසුම් ලියාපදිංචිය අළුත් කිරීම පිළිබඳ ගැසට් පත්‍රයේ පළකල යුතු වුවත් වර්ෂය තුල අළුත් කරන ලද කාර්මික සැලසුම් **157** පිළිබඳව ගැසට් පත්‍රයේ පළකර නොතිබුණු බව නිරීක්ෂණය විය. | කාර්මික සැලසුම් ලියාපදිංචිය අළුත් කිරීම පිළිබඳ ගැසට් පත්‍රයේ පලකිරීමට අවශ්‍ය කටයුතු සකස් කරමින් පවතී. | -එම- |